ලංකා බැංකුව - 2019
-----------------------

**1.1** මතය
------
2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ලංකා බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් පනතේ 5 (1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
---------------------
මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------------------------
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කිරීම, ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම්

හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවක් යන්න, ඉහල මට්ටමේ, තහවුරුවක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිවම හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි හෙළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දූස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට සමූහයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධි හෝ තත්වයන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව; සහ

- බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | මූල්‍ය උපකරණ හානිකරණය පිළිබඳ අතිරේක මඟ පෙන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයට අනුව (ඇමුණුම I), පවත්නා හානිකරණ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීම සඳහා බැංකුව කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.<br><br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුව, පහත සඳහන් කොන්දේසි සපුරාලීමෙන් ණය පහසුකම් ඉහළ අවධියේ සිට පහළ අදියර දක්වා (උදා: 3 වන අදියර සිට 2 වන අදියර දක්වා) වැඩි දියුණු කළ හැකිය.<br><br>- ණය පහසුකම් වැඩිදියුණු කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පමණක් සිදු කළ යුතු අතර ණය සමාලෝචන යාන්ත්‍රණයෙන් ස්වාධීන විය යුතුය.<br><br>- එවැනි වැඩිදියුණු කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද ප්‍රතිපත්තියක්, තාර්කිකත්වයක් සහ ප්‍රමාණවත් ලියකියවිලි සමඟ තහවුරු වීම. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදි. කෙටුම්පත් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර) 09 ක්‍රියාවලි අත්පොතෙහි මෙම ගැටළු විසඳා ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය මෙම වසර අවසන් වීමට පෙර ලබා ගනු ඇත. | නියාමන මාර්ගෝපදේශ හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීම සහ මැනීම පිළිබඳ ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සකස් කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | - ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් වැඩිදියුණු කිරීමේදී, ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු පළමු ප්‍රාග්ධන සහ / හෝ පොලී වාරිකය ගෙවිය යුතු දිනට පසුව අවම වශයෙන් දින 90 ක සතුටුදායක කාර්යසාධන කාලයක් සලකා බැලිය යුතුය. නැවත සකස් කරන ලද පහසුකම් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු ණය හා අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනා ගැනීම සහ ප්‍රතිපාදන කිරීම පිළිබඳ 2008 අංක 3/4 දරණ බැංකු පනත් රේගුලාසිවලට අනුකූල විය යුතුය.<br><br>• අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීමට සහ මැනීමට භාවිතා කරන ආකෘති තහවුරු කිරීම සඳහා බැංකුවට ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි තිබිය යුතුය. | | |
| ii | පොදු ලේජරයට ගැලපීමෙන් තොරව (ශ්‍රී.ල.මු.වා.ප්‍ර ගැලපුම්) මූල්‍ය ප්‍රකාශනවලට සෘජුවම යොදන ලද ජ'නල් සටහන් කිහිපයක් තිබුණි. එවැනි තොරතුරු පැතුරුම්පත් මත පවත්වා ගෙන යනු ලැබේ. මෙය දත්ත නැතිවීමට හෝ හැසිරවීමට හේතු විය හැක.<br>එබැවින්, එවැනි සටහන්වල දත්ත නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ශක්තිමත් ක්‍රියාවලියක අවශ්‍යතාවය බැංකුව විසින් ඇගයීමට ලක් කළ යුතුය. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදි. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මූල්‍ය වාර්තාකරණය සඳහා පද්ධති විසඳුම ක්‍රියාත්මක කිරීමත් සමඟ මෙය විසඳෙනු ඇත. | දත්ත සුරකීම සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණය සඳහා පද්ධති විසඳුමක් සඳහා බැංකුව යා යුතුය. |
| iii | නියමයන් වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ලැබෙන දීර්ඝ කිරීම, ගෙවීම් කල් දැමීම, ගිවිසුම අත්හැරීම (නැවත සැකසන ලද හා ප්‍රතිව්‍යුහගත) ඇතුළු සහන, ණය සහ අත්තිකාරම් " අදියර 3" යටතේ හඳුනා ගත යුතු වුවත්, මූලික බැංකු පද්ධතිය තුළ ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් ග්‍රහණය කර ගැනීම සඳහා බැංකුව සතුව කිසිදු යාන්ත්‍රනයක් නොමැත. එබැවින් බැංකුවේ හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීමේදී එවැනි ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් සලකා බැලීමට ක්‍රමයක් නොමැත. | ප්‍රතිව්‍යුහගත පහසුකම් ග්‍රහණය කර ගැනීම සඳහා මූලික බැංකු පද්ධතිය වෙනස් කිරීම සිදු වෙමින් පවතී. යූ.ඒ.ටී ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2020 දෙසැම්බර් 31 ට පෙර ක්‍රියාත්මක කිරීම අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | ප්‍රතිව්‍යුහගත කරන ලද ණය පහසුකම් සහ අදාළ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කර ඇති වාර ගණන හඳුනා ගැනීමට මූලික බැංකු පද්ධතිය සඳහා සිදු කරන වෙනස් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |

### 1.5.2 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට බදුල්ල , නුවර හා කහටගස්දිගිලිය ශාඛාවල පිළිවෙලින් රු.34,974,551 ක, රු.5,266,076 ක හා රු.3,960,000 ක දිර්ඝ කාලයක් හිඟව පවතින අවිනිශ්චිත ගිණුම් ණයගැති ශේෂයන් නිරීක්ෂණය කරන ලදී. වසර 03 කට වඩා වැඩි කාලයක සිට එම ශේෂයන් එම ගිණුම තුළ පවතී. කහටගස්දිගිලිය ශාඛාවේ දීර්ඝ කාලීන හිඟ ශේෂය නිරවුල් කිරීමට දැන් පියවර ගෙන ඇති අතර මහනුවර ශාඛාව නිවැරදි කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. කෙසේවෙතත්, දැනට පවතින අධිකරණ නඩු හේතුවෙන් බදුල්ල ශාඛාවේ දීර්ඝ කාලී න හිඟ ශේෂයන් නිරවුල් වී නොමැත. | <u>අවිනිශ්චිත ගිණුම් ණය ගැතියන්</u><br>කහටගස්දිගිලිය ශාඛාව - නිවැරදි කරන ලදි<br>බදුල්ලා ශාඛාව - දැනට පවතින අධිකරණ නඩු<br>මහනුවර ශාඛාව - නිවැරදි කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය | දීර්ඝ කාලීන හිඟ ශේෂ නිරවුල් කිරීම සඳහා අවිනිශ්චිත ගිණුම් ණය ගැති සහ ණය හිමි ශේෂයන් නිරීක්ෂණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අනෙකුත් වගකීම් යටතේ වර්ගීකරණය කරන ලද සමහර පොදු ලේජර ගිණුම්වල දීර්ඝ කාලීන හිඟ ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය.<br>එකතුව රු.637, 829, 357 ක් වූ පොදු ලේජර ගිණුම් 19 ක ශේෂයන් 2019 දෙසැම්බර් 31 දිනට සහ 2018 දෙසැම්බර් 31 දිනට එකම වටිනාකමෙන් පෙන්නුම් කරන බව තවදුරටත් නිරීක්ෂණය විය. | 2020 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර ගිණුම් 07 ට අදාළ ශේෂයන් කපා හැරීමට අදාළ ශාඛා විසින් කටයුතු කරනු ලැබේ.<br>පොදු ලේජර අංක 22310044 හි හිඟ ශේෂය නිරවුල් කිරීම සඳහා අදාළ අංශ සමඟ සාමූහිකව සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරනු ලැබේ.<br><br>මෙම කාරණය නිවැරදි කිරීම සඳහා අදාළ අනෙකුත් සියලු පිරිවැය මධ්‍යස්ථාන වෙත 2020 සැප්තැම්බර් 04 දිනැති ලිපියක් මඟින් දැනුම් දී ඇත. | දිගු කාලීන ශේෂයන් පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම හා වළක්වා ගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

i 2019 දෙසැම්බර් 31 වන දිනට ප්‍රධාන අක්‍රීය ගණුදෙනුකරුවන් 20 දෙනාගේ මුළු හිඟ මුදල රු. මිලියන 22, 339.46 ක් වූ අතර එය එම දිනට බැංකුවේ මුළු අක්‍රීය දළ ණය හා අත්තිකාරම්වලින් සියයට 28 ක් නියෝජනය කරයි. විස්තර පහත දැක්වේ.

| අංකය | ගණුදෙනුකරුගේ නම | මුළු හිඟ මුදල (රු. මිලියන ) |
|---|---|---|
| 1 | කේ. ඩී. ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින් (පුද්) සමාගම | 2,636 |
| 2 | ජයවික්‍රම රයිස් (පුද්) සමාගම | 2,1 08 |
| 3 | ධෝලියාධූ ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම | 1,446 |
| 4 | එන්බී ෆුඩ්ස් (පුද්) සමාගම | 1,253 |
| 5 | අනුදාන් හෝල්ඩින් (පුද්) සමාගම | 1,206 |
| 6 | ලින්ක් ඉන්ජිනියරින් (පුද්) සමාගම | 1,193 |
| 7 | රුහුනු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් | 1,183 |
| 8 | ආර්එන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම | 1,144 |
| 9 | කඩුවෙල හෝල්ඩිංග්ස් | 1,106 |
| 10 | ආර්ඩීඑම්ඩී ටෙක්ස්ටයිල් (පුද්) සමාගම | 1,034 |
| 11 | ධූරස් රිට්‍රීට් (පුද්) සමාගම | 947 |
| 12 | කාස්ට්වේ මාලදිවයින (පුද්) සමාගම | 934 |
| 13 | දේශිකා එම්බ්‍රොයිඩරි සොලූෂන් (පුද්) සමාගම | 944.65 |
| 14 | සීඑම්එල්-එම්ටීඩී කන්ස්ට්‍රක්ෂන්ස් සමාගම | 866 |
| 15 | ශාන්බේ ජීන්ස් කොපොරේෂන් (පුද්) සමාගම | 741 |
| 16 | කැන්ඩියන් ආර්ට්ස් සුපර් කම්පෙක්ස් (පුද්) සමාගම | 724.75 |
| 17 | ඉසුරු ඉන්ජිනියරින් (පුද්) සමාගම | 686 |
| 18 | කමල් කේබල්ස් (පුද්) සමාගම | 677 |
| 19 | මෙනක සහල් නිෂ්පාදන (පුද්) සමාගම | 863.06 |
| 20 | නවලෝකා වානේ කර්මාන්ත (පුද්) සමාගම | 647 |
| එකතුව | | **22,339.46** |

එකඟ වේ.

ගනුදෙනුකරුවන් ගෙන් අයවිය යුතු මුළු මුදල අයකර ගැනීම සඳහා බැංකුව සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික වීම.

ii **2019** වර්ෂය තුළදී ණය ප්‍රදානය කරන ලද ගනුදෙනුකරුවන්ගේ ලැයිස්තුවක් පවතින අතර එම ණය අක්‍රීය ණයවලට එම වසරේදීම මාරු කරන ලදි. පහත සඳහන් ගනුදෙනුකරුවන් ඉහත ලැයිස්තුවේ ප්‍රධාන ගනුදෙනුකරුවන්

<u>මෙනක සහල් නිෂ්පාදන (පුද්) සමාගම</u>
පළමු හා දෙවන වසර තුළ පිළිවෙළින් රු. මිලියන **2**.5 ක

කිසියම් ගනුදෙනුකරුවකුට ණය ලබා දීමට පෙර සතුටුදායක ගනුදෙනුකරු

**10** නියෝජනය කරයි.

| අංකය | ණය ගැනුම්කරුගේ නම | **2019** දෙසැම්බර් **31** දිනට මුළු හිඟ මුදල ( රු. මිලියන ) |
|---|---|---|
| 1 | මෙනක සහල් නිෂ්පාදන (පුද්) සමාගම | 850 |
| 2 | එන් ඇන්ඩ් ඒ ඉංජිනේරු සේවා (පුද්) සමාගම | 630 |
| 3 | ජයවික්‍රම සහල් (පුද්) සමාගම | 600 |
| 4 | පිට්ස් එවිඒෂන් (පුද්) සමාගම | 246 |
| 5 | දයා ඇඟලුම් අපනයන (පුද්) සමාගම | 172.62 |
| 6 | ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම | 156 |
| 7 | කේ.ඩී ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩිං (පුද්) සමාගම | 125 |
| 8 | සන්රයිස් ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම | 101 |
| 9 | කොමුති ඉංජිනේරු සේවා (පුද්) සමාගම | 96 |
| 10 | රුහුනු දේව් කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු (පුද්) සමාගම | 95 |
| | එකතුව | **3,071.62** |

හා රු. මිලියන 3.5 ක මාසික ගෙවීම් සඳහා ගණුදෙනුකරු එකඟ වූ අතර ණය කම්ටුවේ අනුමැතිය ලැබුණි.

<u>එන් ඇන්ඩ් ඒ ඉංජිනේරු සේවා (පුද්) සමාගම</u>

ණය තුනක් 2018 අගෝස්තු 29 වන දින ප්‍රදානය කරන ලද අතර එය 2019 පෙබරවාරි 28 වන දින අක්‍රිය අංශයට මාරු කරන ලදී. මෙම ණය 2019 ජුනි 27 දින නැවත සකස් කර බැංකුවේ පවත්නා ණය ප්‍රතිපත්තිය යටතේ අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කරන ලදී.

<u>ජයවික්‍රම සහල් (පුද්) සමාගම</u>

ටී.ආර් පහසුකමේ මුළු ශේෂය නිදහස් කිරීමෙන් පසු, එම ගණුදෙනුකරු ගිණුමට මුදල් ප්‍රවාහ ප්‍රේෂණය කිරීම නවතා ඇති අතර එම නිසා ටී.ආර් පහසුකම හා සියලු කාලීන ණය, අක්‍රීය ණය කාණ්ඩයට මාරු කරන ලදී.

<u>ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම</u>

එකඟ වූ මුදල් ප්‍රවාහ බැංකුව හරහා නොපැමිණීම නිසා පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කරන ලදි.

<u>කේ.ඩී ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩිං (පුද්) සමාගම</u>

ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව, 2018 ජූලි මාසයේදී මෙම සමාගම වෙත ලබා දී ඇති සියලුම පහසුකම් අක්‍රිය අත්තිකාරම් ලෙස බැංකුව වර්ගීකරණය කළ ඇත. එබැවින්, 2018 ජූලි මාසයෙන් පසු සමාගමට ලබා දී ඇති ඕනෑම පහසුකමක් ආරම්භක ප්‍රදානය සමඟ ස්වයංක්‍රීයව අක්‍රීය අත්තිකාරම් අංශයට මාරු කරනු ලැබේ. සියළුම පහසුකම් අක්‍රීය අත්තිකාරම් ලෙස වර්ගීකරණය

ඇගයීම්, බැංකුව විසින් සිදු කර ඇති බවට සහතික වීම.

| | | | |
|---|---|---|---|
| | | කිරීමෙන් පසුව, බැංකුව විසින් 2019 වර්ෂය තුළදී සමාගමට ප්‍රධාන ව්‍යාපෘති තුනක් සඳහා රු. මිලියන 416.31 ක නව පහසුකම් 14 ක් ලබා දී ඇත. (2019.12.31 දිනට හිඟ මුදල රු. මිලියන 124.86 කි). එම ව්‍යාපෘති වලින් බැංකුවට මුදල් ප්‍රවාහ ලැබෙමින් පවතින අතර ව්‍යාපෘති නිම කිරීමේ අදහසින් මාර්ග සංවර්ධන අධිකාරියේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවීම් ඔවුන් වෙත මුදා හරිනු ලැබේ. එබැවින්, බැංකුවේ වක්‍ර නිරාවරණය (ඇප ලිපිය) අඩු කරනු ඇත. බැංකු පහසුකම් වලින් වැඩි කොටසක් මුදල් ප්‍රවාහයෙන් අයකර ගැනේ. (ණය පහසුකම් 14 හි අද දිනට හිඟ මුදල් රු. මිලියන 51.5 කි).<br><br><u>කොමුති ඉංජිනේරු සේවා (පුද්) සමාගම</u><br>රු. මිලියන 300 ක ඉන්වොයිසි වට්ටම් කිරීමේ පහසුකම් යටතේ 2019 දී ලබා දුන් උප ණය, අක්‍රීය අත්තිකාරම් අංශයට මාරු කර ඇති අතර මෙම ඉන්වොයිසිවලට අදාළ ගෙවීම් තවමත් ලැබී නැත.<br><br><u>රුහුනු දේව් කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු (පුද්) සමාගම</u><br>රු. මිලියන 95.0 ක ඉන්වොයිස් වට්ටම් කිරීමේ පහසුකම් යටතේ ලබා දී ඇති උප ණය, අක්‍රීය අත්තිකාරම් අංශයට මාරු කරන ලදී. මෙම ඉන්වොයිසිවලට අදාළ ගෙවීම් තවම ලැබී නැත. | |
| iii | **2019** දෙසැම්බර් **31** දිනට කඩුවෙල හෝල්ඩිංග්ස් (පුද්) සමාගම හා එහි අධ්‍යක්ෂවරුන්ගේ මුළු හිඟ ශේෂය රු.මිලියන 1,120.509 ක් වූ අතර 2017 ජුනි **23** දින ණය, අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත. විස්තර පහත වගුවේ දක්වා ඇත. | එන්තර වාසියක් යවා ඇති අතර ණයගැතියාට සහ ඇපකරුවන්ට එරෙහිව වාණිජ මහාධිකරණයේ නඩු පවරා ඇත. | බැංකුවේ අනුමත ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලියට දැඩිව අනුකූල වීම |

| පහසුකම් අංකය | පහසුකම් මුදල ( රු. මිලියන ) | ප්‍රදානය කරන ලද දිනය | **2019.12.31** දිනට හිඟ මුදල (රු. මිලියන) | **සහතික කිරීම.** |
|---|---|---|---|---|
| කඩුවෙල හෝල්ඩිංග්ස් (පුද්) සමාගම - මෙට්‍රොපොලිටන් ශාඛාව | | | | |
| සී / ඒ 78332257 | පිඔඞී 70.0 | 25.07.2016 | 134.092 | |
| එල්එන් 80186447 | එස්ටීඑල් 100.0 | 16.12.2016 | 95.301 | |
| එල්එන් 80118030 | 1.346 | 29.11.2016 | 1.346 | |
| එල්එන් 80119165 | 0.669 | 29.11.2016 | .669 | |
| ණයවර ලිපි | 400 | 7.07.2016 | 426.579 | |
| උපකල්පිත ණය | 450 | 07.07.2016 | 447.985 | |
| උප එකතුව | | | **1,105.972** | |
| කඩුවෙල ශාඛාව - ඩී සී ජෙ කටුගම්පොල | | | | |
| සී / ඒ 71241036 | ටී.ඔ.ඩී | 13.03.2017 | 10.470 | |
| 60800201500879800 | ලීසිං | 09.09.2015 | 4.067 | |
| උප එකතුව | | | **14.537** | |
| මුළු එකතුව | | | **1,120.509** | |

කඩුවෙල හෝල්ඩිංග්ස් (පුද්) සමාගම සහ එහි අධ්‍යක්ෂවරුන්ට මෙට්‍රොපොලිටන් ශාඛාවෙන් හා කඩුවෙල ශාඛාවෙන් ලබා දී ඇති ණය පිළිබඳව පුද්ගලික විගණන සමාගමක් විසින් 2018 සැප්තැම්බර් 04 දින වෝහාරික විගණන පරීක්ෂණයක් සිදු කර ඇත.පරීක්ෂණයෙන් එක් එක් ශාඛාවේ පහත සඳහන් දූර්වලතා අනාවරණය විය.

<u>මෙට්රොපොලිටන් ශාඛාව</u>

- මෙට්රොපොලිටන් ශාඛාවේ නිලධාරීන් විසින් පහසුකම් ලබා දීමේදී හා සමාගම විසින් මුදල් භාවිතා කිරීම අධීක්ෂණය කිරීමේදී නිසි පරිදි කාර්යයන්හි නොයෙදීම.
- නිලධාරීන්ගේ අධිකාරී සීමාවන් අවභාවිතා කිරීම.
- අනවසර සීමා ඉක්මවීම් පිරිනැමීම.
- බැංකුවේ අරමුදල් හරහා පහසුකම් පියවීම.
- ණයවර ලිපි හා උපකල්පිත ණයවල හිඟ මුදල අයකර ගැනීමට අසතුටුදායක ක්‍රියාමාර්ග ගැනීම.

<u>කඩුවෙල ශාඛාව</u>

- අදාළ අනුමැතීන් ලබා නොගැනීම.
- ප්‍රදානය කරන ලද අවසර නොලත් තාවකාලික අයිරා පහසුකම් අය නොවීම.
- නිලධාරීන්ගේ අධිකාරී සීමාවන් අවභාවිතා කිරීම.
- අනවසර සීමා ඉක්මවීම් පිරිනැමීම.

| | | | |
|---|---|---|---|
| iv | කේ.ඩී. ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින් (පුද්) සමාගමේ සමස්ත හිඟ ණය මුදල රු. මිලියන 7,730.592 කි. කේ.ඩී. ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින් (පුද්) සමාගමට ලබා දී ඇති ණය පිළිබඳව පුද්ගලික විගණන සමාගමක් විසින් 2018 නොවැම්බර් මාසයේදී පවත්වන ලද වෝහාරික විගණන පරීක්ෂණයෙන් බැංකුව විසින් කරන ලද අධික මූලනය පැහැදිලිව අනාවරණය වී ඇත. බැංකුව විසින් ඇතැම් නියමයන් හා කොන්දේසි නිකුත් කර ඇති අතර එම ගණුදෙනුකරු විසින් එවා ඉටු කර නොමැත. පහසුකම් ප්‍රතිව්‍යුහගත කරමින් තිබියදීත්, ගණුදෙනුකරු විසින් එම කොන්දේසිවලට අනුකූල වීම සහතික කිරීමට බැංකු අසමත් වී ඇත. පහසුකම් පිළිබඳ විස්තර පහත වගුවේ සාරාංශ කොට ඇත. | වරින් වර බැංකුව විසින් පනවා ඇති නියමයන් හා කොන්දේසි පිළිපැදීමේ අවශ්‍යතාවය බැංකුව සමාගමට දන්වා ඇති අතර සමාගමට ඒවා සපුරාලීමට නොහැකි විය. කෙසේ වෙතත්, පහසුකම් සමීපව අධීක්ෂණය කිරීමේ අදහසින්, ණය ලිපිගොනු 2020 සැප්තැම්බර් මාසයේදී ව්‍යාපාර පුනර්ජීවන ඒකකයට මාරු කරන ලදී. | බැංකුවේ අනුමත ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලියට දැඩිව අනුකූල වීම සහතික කිරීම. |

| පහසුකම් වර්ගය | **2019** දෙසැම්බර් **31** දිනට හිඟ ශේෂය ( රු.මිලියන ) |
|---|---|
| ණය | 2,070.106 |
| අයිරා පහසුකම් | 172.568 |
| ලීසිං පහසුකම් | .832 |
| ඇප ඉල්ලීමේ ලිපි | 392.307 |
| ඍජු නිරාවරණය | 2,635.813 |
| ඇප ලිපි | 5,094.779 |
| මුළු නිරාවරණය | **7,730.592** |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 13/2018, වගන්තිය අංක **11.9** | පිරියත, යන්ත්‍ර සහ උපකරණ උකස් කිරීම බාහිර තක්සේරු වාර්තාවක් මත පදනම් විය යුතුය. එවැනි තක්සේරුවක් නොමැති විට, අත්පත් කර ගත් වර්ෂයේ සිට සියයට 20 ක ක්ෂය වීමේ අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන ශුද්ධ පොත් අගය, උකස් කළ අගය ලෙස ගත යුතුය.<br><br>මානුක් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගමේ යන්ත්‍රෝපකරණ සහ තේ කර්මාන්ත ශාලාව, 2016 දෙසැම්බර් 07 දින ප්‍රදානය කරන ලද රු. 327,000,000 ක් වටිනා ණය සඳහා උගසට තබා ඇති නමුත් යන්ත්‍රෝපකරණ 03 ක් හැර අනෙකුත් සියලුම යන්ත්‍රෝපකරණ සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති අතර එවායේ ශුද්ධ පොත් අගය ශූන්‍ය ලෙස පෙන්නුම් කරයි. | නිවැරදි කරන ලදී.<br>බැංකුවේ තක්සේරුකරු විසින් ලබා දී ඇති තක්සේරුව බැංකුව විසින් සලකා බැලූ අතර 2018 සැප්තැම්බර් 16 වන දින නව තක්සේරුවක් කැඳවා ඇත. බැංකුව විසින් ලබා දී ඇති පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා වර්තමාන තක්සේරුව ප්‍රමාණවත් වේ. | අදාළ කාර්යාල උපදෙස් චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම. |
| කාර්යාල | ශාඛාවේ තාවකාලික අයිරා පහසුකම් පිළිබඳව | <u>එන්.එස්. අමරසේකර</u> | තාවකාලික අයිරා |

| | | | |
|---|---|---|---|
| උපදෙස් චක්‍ර ලේඛ අංක 90/99 | ශාඛාව සමීපව අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම අවශ්‍ය වුවද, **2019** දෙසැම්බර් **31** දිනට රු. මිලියන 1,091 ක් වූ මුළු තාවකාලික අයිරා පහසුකම් (ටී.ඕ.ඩී), ප්‍රමාණවත් අය කර ගැනීමේ ක්‍රියාමාර්ග නොගෙන අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත. පහත සඳහන් ප්‍රධාන ගනුදෙනුකරුවන් **10** හඳුනා ගන්නා ලදි.<br><br>අංකය / ගණුදෙනුකරුගේ නම / ටී.ඕ.ඩී පහසුකම (රු. මිලියන)<br>1 / එන් එස් අමරසේකර / 225<br>2 / ගුණතිලක කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම / 187<br>3 / ආර්ඩීඑම්ඩී ටෙක්ස්ටයිල් (පුද්) සමාගම / 108<br>4 / වෝකර් සන්ස් ඇන්ඩ් කම්පනි එන්ජිනියර්ස් (පුද්) සමාගම / 104<br>5 / සී ජේ ක්රුස් / 99<br>6 / එස් එස් ක්රුස් / 99<br>7 / සීමාසහිත එල් එච් පියසේන සහ සමාගම / 76<br>8 / ෂාන් ට්‍රා ඇන්ඩ් ටුවර්ස් (පුද්) සමාගම / 67<br>9 / එම් එස් කඩුවෙල හෝල්ඩිංග්ස් (පුද්) සමාගම / 64<br>10 / එම් එස් බොබී ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම / 62<br>එකතුව / / **1,091** | එන්තර වාසියක් යවා ඇති අතර ඒ අතර තුර, ගණුදෙනුකරු සහ මහා භාණ්ඩාගාරය අතර හේරුම්කරණයක් ඇති බව දන්වා ඇත.<br><br><u>ගුණතිලක කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම</u><br>සමාගමට හා අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නඩු පවරා ඇති අතර සමාගම හා අධ්‍යක්ෂවරුන් ලබා දී ඇති ලිපිනයන්හි නොමැති බැවින් සිතාසි ලබා දීමට නොහැකි වී ඇත.<br><br><u>ආර්.ඩී.එම්.ඩී ටෙක්ස්ටයිල් (පුද්) සමාගම</u><br>මෙම පහසුකම මේ වන විට නැවත සකසා ඇති අතර ගණුදෙනුකරු ආපසු ගෙවීම ආරම්භ කර ඇත. මේ දක්වා හිඟ මුදල් නොමැත.<br><br><u>වෝකර් සන්ස් ඇන්ඩ් කම්පනි එන්ජිනියර්ස් (පුද්) සමාගම</u><br>රු. මිලියන 100 ක අයිරා පහසුකමක් ලබා දුන් ව්‍යාපෘතියක් සඳහා සමාගමට ඇමරිකානු ඩොලර් මිලියන 2.6 ක් පමණ ලැබිය යුතුය. ඉතිරි ගෙවීම ලබා ගැනීම සඳහා සමාගම තම සේවාදායකයා සමඟ සාකච්ඡා කරමින් සිටී.<br><br><u>සී ජේ ක්රුස්</u><br>මෙම බැංකු අයිරාව වංචනික ගනුදෙනුව නිසා නිර්මාණය වී ඇත. අභ්‍යන්තර පරීක්ෂණය දැනටමත් සිදු කර ඇති අතර ඊට සම්බන්ධ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේ.<br><u>එස් එස් ක්රුස්</u><br>මෙම බැංකු අයිරාව වංචනික ගනුදෙනුව නිසා නිර්මාණය වී ඇත. අභ්‍යන්තර පරීක්ෂණය දැනටමත් සිදු කර ඇති අතර ඊට සම්බන්ධ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට එරෙහිව විනය | පහසුකම් අක්‍රීය ණය කාණ්ඩය වෙත මාරු වීම වැළැක්වීම සඳහා ඒවා සමීපව අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රියාමාර්ග ගෙන තිබේ.<br><br>සීමාසහිත එල් එච් පියසේන සහ සමාගම<br>බැංකුව සමඟ සාකච්ඡා කිහිපයකින් පසුව සමාගම සහ එහි අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දේපළ දෙකක් විකිණීමෙන් අවම වශයෙන් රු. මිලියන 300 ක් තැන්පත් කිරීමට එකඟ විය. කෙසේ වෙතත්, මෙය මේ දක්වා ක්‍රියාත්මක නොවීය.<br>අයකර ගැනීමේ සැලසුම් කිහිපයක් බැංකුව විසින් යෝජනා කර ඇත. කෙසේ වෙතත්, අවසානයේදී අධ්‍යක්ෂවරුන් කිසියම් විකල්පයක් හෝ ක්‍රියාත්මක කිරීමේ ඔවුන්ගේ නොහැකියාව පිළිබඳව සන්නිවේදනය කරන ලදි.<br>පුනර්ජීවන ක්‍රියාමාර්ග ගැනීමට සමූහයේ මුළු ණය පැකේජය 2020 දෙසැම්බර් මාසයේ සිට "ව්‍යාපාර පුනර්ජීවන ඒකකයට" මාරු කරන ලදී.<br><br>ෂාන් ට්‍රා ඇන්ඩ් ටුවර්ස් (පුද්) සමාගම<br>නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පවතින ලේඛන නීති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.<br><br>එම් එස් බොබී ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම<br>ගණුදෙනුකරු මහ හරමින් සිටී. නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජනාධිපති උපදේශකයෙකු සමඟ තවදුරටත් නීතිමය උපදෙස් ලබා ගනී. | |
| කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක 46/2010 වගන්තිය අංක **7.5** | කැරට් 18 ට අඩු ද්‍රව්‍යය පිළිගත යුතු නොවේ. කෙසේ වෙතත් ශාඛා පරීක්ෂාවන්හිදී, මරදාන ශාඛාවේ අවස්ථා **08** කදී සහ මිනුවන්ගොඩ ශාඛාවේ අවස්ථා 01 කදී බැංකුව කැරට් 18 ට අඩු ද්‍රව්‍යය පිළිගෙන ඇති බව නිරීක්ෂණය විය. | මරදාන ශාඛාව<br>මාසයක් ඇතුළත ද්‍රව්‍යය නිදහස් කර ගැනීමට ණයගැතියාට දැනුම් දී ඇති අතර පසු විපරම් ක්‍රියාමාර්ග<br>ගනු ලැබේ. කැරට් 18 ට අඩු | අදාළ කාර්යාල උපදෙස් චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | ද්‍රව්‍යය භාර නොගන්නා ලෙස අදාළ කාර්ය මණ්ඩලයට උපදෙස් දී ඇත.<br><br><u>මීනුවන්ගොඩ ශාඛාව</u><br>නිවැරදි කරන ලදි. (ගණුදෙනුකරු විසින් ද්‍රව්‍යය නිදහස් කර ගෙන ඇත.) කැරට් 18 ට අඩු ද්‍රව්‍යය භාර නොගන්නා ලෙස අදාළ කාර්ය මණ්ඩලයට උපදෙස් දෙමින් ඇත. | |
| 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පිඊඞී 03/2016, (2) ඡේදය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අදාළ රෙගුලාසිවලට අනුකූලව රජයට අයත් ආයතනවල සේවකයින් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ උපයන විට ගෙවන බදු බද්ධට යටත් සේවකයින්ගේ ඉපැයීම්වලින් අඩු කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව සහ ලංකා බැංකුවේ සේවක සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම මගින් සේවකයින්ගේ වැටුප් වලින් අඩු නොකර සේවකයින්ගේ ආදායම් බදු වගකීම් බැංකුව විසින් ගෙවීමට නියම කරයි. ඒ මත පදනම්ව, සේවකයින්ගේ ඉපයීම් වලින් අඩු කිරීමෙන් තොරව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවන බදු ලෙස බැංකුව විසින් රු. 681,789,671 ක් ගෙවා ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව බැංකුව සහ ලංකා බැංකුවේ සේවක සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම මත පදනම්ව, සේවා යෝජකයා ලෙස බැංකුව විසින් සේවකයින්ගේ ආදායම් බදු වගකීම ඔවුන්ගේ වැටුපෙන් අඩු කිරීමකින් තොරව පියවයි. | රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පිඊඞී 03/2016 යටතේ නිකුත් කර ඇති උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම. |

බැංකුව හරහා මඩකලපුව කැම්පස් (පුද්) සමාගම සහ අනුබද්ධ ආයතන වෙත මූල්‍ය ප්‍රේෂණය ලැබීම
---------------------------------------------------------------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| 2017 අංක 12 දරන විදේශ විනිමය පනත / 1953 අංක 24 දරන විනිමය පාලන පනත. | ආකෘති පත්‍ර I සහ II භාවිතා කරමින් විදේශ විනිමය මිලදී ගැනීම සහ විකිණීම මහ බැංකුවට වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, කොල්ලුපිටිය හා කාතන්කුඩි ශාඛාවල පවත්වාගෙන යනු ලබන ගිණුම් 04 ට ලද රු.504,710,570 ක් වටිනා ප්‍රේෂණ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා වන සාක්ෂි විගණනය සතු නොවීය. | සාමාන්‍යයෙන්, මිලියනයකට වඩා වැඩි ලද ප්‍රේෂණ සෑම දෙසතියකින්ම ශ්‍රී ලංකා මහ බැංකුවට බැංකුව විසින් වාර්තා කරනු ලැබේ.<br><br>ඒ අනුව නිරීක්ෂණයේ සඳහන් සියලුම ප්‍රේෂණ මහ බැංකුවට වාර්තා කර ඇත.<br><br>තවද, මහ බැංකුවේ විදේශ විනිමය ජාල පද්ධතියට දත්ත ඉදිරිපත් කරන අවස්ථාවේ දී සහ පරිවර්තනය කරන අවස්ථාවේ දී II වන ආකෘතිය යටතේ මහ බැංකුවට ලද | අදාළ පනත් යටතේ ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රේෂණ වාර්තා කර ඇත.<br><br>විදේශ විනිමය ජාල පද්ධතිය මහ බැංකුව විසින් වර්තමානයේදී අත්හිටුවා ඇති අතර එම නිසා විගණක විසින් ලබා දුන් ප්‍රකාශයේ නිරවද්‍යතාවය තහවුරු කිරීමට බැංකුවට හැකියාවක් නැත.<br>තවද, මහ බැංකුවේ නව ක්‍රමය යටතේ II වන ආකෘති පත්‍රය භාවිතා කරමින් වාර්තා කරනු ලබන ගනුදෙනු වල උපස්ථ නඩත්තු කිරීමේ යාන්ත්‍රණයක් බැංකුව විසින් දැන් ස්ථාපිත කර ඇත.<br><br>ආකෘති පත්‍ර I සහ II භාවිතා කරමින් විදේශ විනිමය මිලදී ගැනීම් සහ විකුණුම් ගනුදෙනු වාර්තා කිරීම සඳහා පද්ධතියක් දැන් බැංකුවේ ක්‍රියාත්මක වේ. | |
| වගන්ති අංක 8.3 | කේ.වයි.සී ආකෘතියේ සඳහන් අරමුදල් සහ ධනයේ ප්‍රභවයන් හෝ අරමුදල් භුක්තිවිඳීමේ අයිතිය දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින්ට අදාළව හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, අරමුදල් ප්‍රභවය සහ ධනයේ ප්‍රභවය යටතේ එය “වෙනත්” ලෙස සඳහන් කර ඇති අතර විදේශ ප්‍රේෂණය ලෙස සඳහන් කර ඇත. එහෙත් නිශ්චිත විදේශීය ආයෝජකයා හඳුනාගෙන නොතිබුණි. | ජාත්‍යන්තර බැංකු හරහා ලැබෙන මුදල් නෛතික ප්‍රභවයන්ගෙන් ලැබෙන ලෙස සාධාරණව සැලකිය හැකි අතර, බැංකුව විසින් නැවත අරමුදලේ / ධනයේ ප්‍රභවයන් සොයා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත.<br><br>බැංකුවට ලබා දී ඇති උපදෙස් අනුව ලද ප්‍රේෂණ මගින් ලැබෙන මුදල් බැංකුව විසින් නිවැරදිව අදාළ ප්‍රතිලාභී ගිණුම්වලට බැර කර ඇත. එසේම, අරමුදල්වල අරමුණ / භාවිතය ද බැංකුව විසින් නිසි පරිදි හඳුනාගෙන ඇත. | අදාළ කාර්යාල උපදෙස් චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් අනුව දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයින්ගේ අරමුදල් ප්‍රභවයන් පැහැදිලිව හඳුනාගත යුතුය. |
| වගන්ති අංක 12.1 | දේශපාලනිකව නිරාවරණය වන පුද්ගලයින් සඳහා ගණුදෙනුකරුගේ අවදානම් පැතිකඩ මත පදනම්ව අඛණ්ඩ නිසි සම්ප්‍රජන්‍යතාව සඳහා අවශ්‍ය අවම වාර ගණන සෑම මාස 06 ක් තුළ වේ. කෙසේ වෙතත් , කොල්ලුපිටිය ශාඛාව විසින් සෑම මාස 06 ක කාලයක් තුළම දේශපාලනිකව | චක්‍රලේඛ උපදෙස් අනුව අදාළ ශාඛා සමාලෝචනය කර ඇති බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි නොමැත. | අදාළ කාර්යාල උපදෙස් චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම |

| | | | |
|---|---|---|---|
| | නිරාවරණය වන පුද්ගලයින්ගේ ගිණුම් සඳහා නිසි සම්ප්‍රජන්‍යතාව ලබා ගෙන ඇති බවට සහතික වීමට සාක්ෂි නොමැත. | අඛණ්ඩ නිසි සම්ප්‍රජන්‍යතාව ලෙස ශාඛා විසින් පහත පියවර ගෙන ඇත.<br><br>• ගනුදෙනුකරුවන්ගේ ගිණුමට ලද ප්‍රේෂණ බැර කිරීමට පෙර ගනුදෙනුකරුවන්ගෙන් විමසීම.<br><br>• මුදල් ශුද්ධිකරණ ගනුදෙනු වැළැක්වීම සඳහා බැංකුව විසින් භාවිතා කරන ලද ඇම්ලෝක් පද්ධතිය මගින් හඳුනාගත් අසාමාන්‍ය ගනුදෙනු පිළිබඳව අදාළ ශාඛා නිලධාරීන් විසින් ගණුදෙනුකරුවන්ගෙන් විමසීම.<br>බැංකුව 2019 මාර්තු සිට ඒ.එම්.එල් සහ සී.එෆ්.ටී අරමුණු සඳහා "ක්ලාරි5" ක්‍රමය භාවිතා කරයි.<br><br>දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයින් සහ ඉහළ අවදානම් සහිත ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාර ගනුදෙනු පිළිබඳව අඛණ්ඩව නිසි සම්ප්‍රජන්‍යතාව හැසිරවීමට මෙම ක්‍රමය භාවිතා කරයි. | සහතික කිරීම. |
| වගන්ති අංක 4.3 | තෙවන පාර්ශවීය ගනුදෙනුකරුවෙකු විසින් වෙන වෙනම හෝ එකතුවක් වශයෙන් ගිණුමකට රු. ලක්ෂ දෙකකට (රු.200,000) වඩා හෝ ඊට සමාන විදේශ මුදල් තැන්පත් කිරීමේදී, නම, ලිපිනය, වලංගු හැඳුනුම්පත් ලේඛනයක අංකය, අරමුණ සහ තෙවන පාර්ශවීය ගනුදෙනුකරුගේ අත්සන පිළිබඳව වාර්තාවක් තිබිය යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් නිශ්චිත තොරතුරු සඳහන් නොකරමින් රු. 60,980,000 ක මුදලක් ජංගම මුදල් තැන්පතුවක් ලෙස මඩකලපුව කැම්පස් (පුද්) සමාගමේ ගිණුමට තැන්පත් කර තිබුණි. | අවස්ථා 10 න් 9 ක්ම කාන්තාක්කුඩි ශාඛාවේ දී සිදු කරන ලදී.<br>මෙම තැන්පතු ආයතනයේ සේවකයින් දෙදෙනෙකු විසින් සිදු කර ඇති බවත්, එම පුද්ගලයින්දෙදෙනා ගනුදෙනුක රුගේ නියෝජිතයන් ලෙස එදිනෙදා බැංකු කටයුතු සඳහා නිතිපතා ශාඛාවට පැමිණෙන බවත් ශාඛා කළමනාකරු තහවුරු කරන ලදී.<br><br>තවද, එම සේවකයින් ආයතනයේ සේවය කරන බව | අදාළ කාර්යාල උපදෙස් චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් වල ට අනුකූල වීම සඳහා රු. 200,000 ට වැඩි තැන්පතු කිරීමේදී අදාළ තොරතුරු ඇතුළත් කර ඇති බවට සහතික වීම. |

| | | | |
|---|---|---|---|
| | | කළමනාකරු හොඳින් දැන සිටි හෙයින්, එම තැන්පතු තෙවන පාර්ශවයක් විසින් කරන ලද තැන්පතු ලෙස සලකා නොතිබුණි.<br><br>ඉතිරි මුදල් තැන්පතුව වූ රු. 500,000 ක් බත්තරමුල්ල ශාඛාව හරහා තැන්පත් කර තිබුණි. | |
| වගන්ති අංක 3.3.14 | එක් ගනුදෙනුකරුවෙකු විසින් ගිණුම් දෙකක් හෝ වැඩි ගණනක් විවෘත කරනු ලබන විට, සියළුම ගිණුම්වල අඛණ්ඩ ගනුදෙනුකරුගේ නිසි සම්ප්‍රජන්‍යතාව සක්‍රීය කිරීම සඳහා එවැනි ගිණුම් විවෘත කරනු ලබන නිශ්චිත අරමුණ සටහන් කර ගත යුතුය.<br><br>කෙසේ වෙතත්, ගනුදෙනුකරු විසින් කොල්ලුපිටිය ශාඛාවේ සහ වැලිකන්ද ශාඛාවේ ගිණුම් දෙකක් විවෘත කිරීමේදී නිශ්චිත අරමුණු පැහැදිලිව සඳහන් කර නොමැත.<br><br>" ව්‍යාපාරයේ ස්වභාවය" යන මාතෘකාව යටතේ කොල්ලුපිටිය ශාඛාවේ ගිණුම විවෘත කිරීමේදී "උසස් අධ්‍යාපන ආයතනයක්" ලෙස නිශ්චිත අරමුණ සඳහන් කර ඇති අතර වැලිකන්ද ශාඛාවේ ගිණුම විවෘත කිරීමේදී එය "අධ්‍යාපනය" ලෙස සඳහන් කර ඇත. | මඩකලපුව කැම්පස් (පුද්) සමාගම කොල්ලුපිටිය ශාඛාවේ ගිණුම් දෙකක් විවෘත කර තිබූ අතර එම ගිණුම් දෙක අතරින්, ගිණුම් අංක 78495137 දරන ගිණුම ව්‍යාපාරය කටයුතු සඳහා ශ්‍රී ලංකා රුපියල් වලින් විවෘත කර තිබුණි.<br><br>ඇමෙරිකානු ඩොලර්වලින් නාමනය කරන ලද ගිණුම් අංක 79387634 දරන ගිණුම කොල්ලුපිටිය ශාඛාවේ 2016 ජූනි 30 වන දින විවෘත කරන ලද අතර මෙම ගිණුම හරහා කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.<br><br>එම ගිණුමට අමතරව බැංකුවේ වැලිකන්ද ශාඛාවේ දී ශ්‍රී ලංකා රුපියල් වලින් නාමනය කරන ලද ගිණුම් අංක 82603832 දරන ජංගම ගිණුම මඩකලපුව කැම්පස් එකේ ඉදිකිරීමේ කටයුතුවල නිරතව සිටි සේවකයින්ගේ වැටුප් ගෙවීම් අරමුණින් විවෘත කර තිබුණි.<br><br>ඔහුන් වැලිකන්ද ශාඛාව තෝරා ගෙන ඇත්තේ එය ඉදිකිරීම් ස්ථානයට ආසන්නම ශාඛාව වන බැවිනි. | අදාළ කාර්යාල උපදෙස් චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම. |
| වගන්ති අංක 3.1.1 | කිසියම් නිර්නාමික ගිණුමක්, ව්‍යාජ නමක් හෝ ව්‍යාජ පුද්ගලයෙකුගේ නමක් හෝ අංකයකින් | 2013 ජූනි මස 11 වන දින තරුණ කටයුතු හා නිපුණතා | අදාළ කාර්යාල උපදෙස් |

| | | |
|---|---|---|
| පමණක් හඳුනාගත හැකි ඕනෑම ගිණුමක් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ නඩත්තු කිරීම තහනම්ය. ව්‍යාපාර ලියාපදිංචිය සඳහා ලේඛනමය සාක්ෂි නොමැති වුවද, ගිණුම් අංක 74791337 දරන ජංගම ගිණුම "මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් යුනිවසිටි කොලෙජ්" නමින් විවෘත කර තිබුණි. | සංවර්ධන අමාත්‍යාංශය හා හිරා පදනම අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මත පදනම් බැංකුවේ කාන්තන්කුඩි ශාඛාව විසින් ගිණුම් අංක 74791337 දරන ගිණුම "මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් යුනිවසිටි කොලෙජ් මඩකලපුව" නමින් විවෘත කර තිබුණි.<br><br>ජංගම ගිණුම විවෘත කරන ලෙස හිරා<br>පදනමේ සභාපති කළමනාකරු ගෙන් ඉල්ලා ඇත.<br><br>**2013** ජුනි 19 දිනැති ලිපිය මඟින් හිරා පදනමේ සභාපති විසින් "මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් යුනිවසිටි කොලෙජ් මඩකලපුව" නමින් ජංගම ගිණුමක් කාන්තන්කුඩි ශාඛාවේ විවෘත කරන මෙන් ඉහත අවබෝධතා ගිවිසුමේ පිටපත් සහිතව කාන්තන්කුඩි ශාඛාවේ කළමනාකරුගෙන් ඉල්ලීමක් කර ඇත.<br><br>ගිණුම විවෘත කරන අවස්ථාවේ දී, ව්‍යාපාර ලියාපදිංචිය නොමැති වීම පිළිබඳව ශාඛාවේ කළමනාකරු විසින් විමසා තිබුණු අතර යෝජිත කැම්පස් එක "මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් යුනිවසිටි කොලෙජ් මඩකලපුව" යන නමින් නම් කිරීමට බලාපොරොත්තු වන බව ගණුදෙනුකරු විසින් ඔහුට දැනුම් දී තිබුණු අතර ජංගම ගිණුම එම නමින් විවෘත කරන ලෙස දන්වා තිබුණි.<br>තවද, එම කාලය තුළ පළ වූ පුවත්පත් ලිපි සහ අන්තර්ජාලයේ ලිපි මඟින් එය සනාථ වූ බව කළමනාකරු විසින් ප්‍රකාශ කරන ලදි. එම ලිපි තවමත් අන්තර්ජාලයේ කියවිය හැකිය. ඉහත සඳහන් කරුණු | චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | මත පදනම්ව, "මලික් අබ්දුල්ලා බින් අබ්දුල් අසීස් යුනිවසිටි කොලෙජ් මඩකලපුව" යන නමින් ගිණුම විවෘත කරන ලදී. | |
| ඇමුණුම **IV** | හත සඳහන් අනතුරු ඇඟවීම් හඳුනා ගෙන තිබියෙදීත්, බැංකුව විසින් ඒවා කෙරෙහි කිසිදු අවධානයක් යොමු කර නොමැත.<br>ඒ) ව්‍යාපාරික හේතුවක් නොමැතිව නිතර නිතර විශාල වටිනාකම් සහිත ගනුදෙනු පෙන්වන ගිණුමක් වීම.<br><br>බී) විශේෂයෙන් පසුකාලීන විදේශ මාරු කිරීම් පවතින, ගනුදෙනුකරුගේ හඳුනා ගෙන ඇති ව්‍යාපාරික පිරිවැටුමට අනුරූප නොවන විශාල ශේෂයන් ගොඩනංවන ගනුදෙනුකරුවකු වීම.<br><br>සී) තැන්පතු හෝ මුදල් ආපසු ගැනීම මූලික වශයෙන් චෙක්පත් වලට වඩා මුදල් වලින් සිදු කරන ව්‍යාපාරික ගිණුම් වන අතර මෙය එම ආකාරයේ ව්‍යාපාරයක සුපුරුදු ක්‍රියාකාරකම් සමඟ නොගැලපේ.<br><br>ජෙ) පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් එකම ගිණුමට මුදල් තැන්පත් කිරීම.<br><br>කියු) ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු හෙළි කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශන සැපයීමට අකමැති ව්‍යාපාරයක් වීම.<br><br>වයි) විවිධ ගනුදෙනු වලට සම්බන්ධ පූණ්‍ය / සහන සංවිධානයක් වීම.<br><br>ඊඊ) ගනුදෙනුවකට බහු පාර්ශ්වයන් සම්බන්ධ වීම හා සංකීර්ණ ගනුදෙනුවක් වීම. | **(ඒ)** කොටස<br>කැම්පස් එකක් පිහිටුවීමේ අරමුණින් ගිණුම විවෘත කර තිබුණි. මෙම අරමුදල් කැම්පස් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා යොදා ගන්නා බව ගිණුමේ බලයලත් නිලධාරීන් විසින් දැනුම් දී තිබුණි. එම කාලය තුළදී ගනුදෙනු පරිමාව සාධාරණීකරණය කරමින් යෝජිත ඉඩමෙහි මහා පරිමාණ ගොඩනැගිලි ඉදිකිරීම් සිදු වෙමින් පැවතුනි.<br><br>**(බී)** කොටස<br>ගිණුම විවෘත කරන අවස්ථාවේ දී, අරමුදල් ප්‍රභවය විදේශ ප්‍රේෂණ ලෙස සහ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 10,000 ට වඩා වැඩි බව කේ.වයි.සී හි සඳහන් කර ඇත. එබැවින් මෙම ගිණුම නිශ්චිත අරමුණක් සඳහා විවෘත කර ඇති බව නිරීක්ෂණය වූ අතර ගිණුම විවෘත කරන අවස්ථාවේදී එය හෙළි කර තිබේ.<br><br>**(සී)** කොටස<br>කැම්පස් එකක් පිහිටුවීමේ අරමුණින් මෙම ගිණුම විවෘත කර ඇත. ප්‍රේෂණවල ස්වභාවය විදේශීය ප්‍රේෂණ බව ගිණුම විවෘත කරන අවස්ථාවේ දී ගනුදෙනුකරු විසින් හෙළි කර ඇත. එබැවින් එය ව්‍යාපාර ගිණුමක සුපුරුදු ක්‍රියාකාරකම් වලට වඩා වෙනස් වේ.<br>**(ජෙ)** කොටස<br>මෙය සිදුවී ඇත්තේ ගිණුම් විවෘත කිරීමේ ස්වභාවය හේතුවෙනි.<br><br>**(කියු)** කොටස<br>නිශ්චිත අරමුණක් සඳහා මෙම | අදාළ කාර්යාල උපදෙස් චක්‍රලේඛය යටතේ ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම. |

ගිණුම විවෘත කර ඇති අතර ගිණුම විවෘත කරන අවස්ථාවේදී ගනුදෙනුකරු එය හෙළි කර තිබේ. ගනුදෙනුකරුගේ මූල්‍ය ප්‍රකාශන සඳහා බැංකුව ඉල්ලීමක් කර නැත.

(වයි) කොටස
බැංකුවට ඉදිරිපත් කරන ලද ලියකියවිලි අනුව මෙය පුණ්‍ය / සහන සංවිධානයක් නොවේ.

( ඊ්) කොටස
ස්විෆ්ට් හරහා ගිණුමට ප්‍රේෂණ ලැබී ඇත. එබැවින් ගනුදෙනු සංකීර්ණ ගනුදෙනු ලෙස බැංකුව විසින් සලකනු නොලැබේ.

## 1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | විගණනයේදී එකතු කරන ලද පරිශීලක ලැයිස්තුවල ප්‍රමාණවත් පරිශීලක ගිණුම් විස්තර බැංකුව විසින් පවත්වාගෙන නොයයි. ප්‍රමාණවත් පරිශීලක ගිණුම් විස්තරවල ඇතුළත් නොවූ එවැනි ප්‍රමාණවත් නොවන තොරතුරු පහත වගුවේ දැක්වේ.<br><br>ඇතුළත් නොවූ ක්ෂේත්‍රය — යෙදුම්<br>අක්‍රිය කිරීමේ දිනය — ප්‍රයිම් 4 පද්ධතිය, භාණ්ඩාගාර පද්ධතිය, අයි.සී.බී.එස් පද්ධතිය | ප්‍රයිම් 4 හි පරිශීලක හැඳුනුම්පත් අක්‍රිය කිරීම, ක්‍රියාකාරී නාමාවලිය හරහා සිදු වන අතර අක්‍රිය කිරීමේ දිනය ලොග්වල පවතී.<br><br>අවසන් පරිශීලක හැඳුනුම්පත් වෙනස් කිරීමේ දිනය භාණ්ඩාගාර සහ අයි.සී.බී.එස් පද්ධතිවල සටහන් වන අතර අක්‍රිය කිරීමේ දිනය ඒවා මඟින් ලබා ගත හැක. | ප්‍රමාණවත් පරිශීලක ගිණුම් තොරතුරු නඩත්තු කිරීම සහතික කිරීම සහ විස්තර විගණන කටයුතු සඳහා ලබා දීම. |
| ii | **2020** ජනවාරි **20** දින සිදු කරන ලද වීගණකගේ සමාලෝචනයේදී, ඉල්ලා අස්වූ පරිශීලක ගිණුම් **32** ක් කල්බදු පද්ධතියේ අක්‍රිය නොවී ඔහුන් අස්වූ දිනවලට | මුරපද දැනටමත් අක්‍රිය කර ඇත. ඇමුණුමේ සඳහන් පරිදි පරිශීලක ගිණුම් අක්‍රිය කිරීමට | ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක |

| | | | |
|---|---|---|---|
| | පසුවත් සක්‍රීයව පවතුණි. | පියවර ගෙන ඇත. | ගිණුම් කල්බදු පද්ධතියෙන් නියමිත වේලාවට අක්‍රිය කිරීමට පියවර ගත යුතුය. |
| iii | **2020** ජනවාරි **20** දින සිදු කරන ලද විගණකගේ සමාලෝචනයේදී, මූල්‍ය කාලපරිච්ඡේදය තුළදී පරිශීලකයින් අදාළ පද්ධති තුළට ප්‍රවේශ වී නොතිබූ බැවින් භාවිතයට නොගත් පරිශීලක ගිණුම් 13, 18, 40 සහ 27 පිළිවෙළින් පිනැකල් භාණ්ඩාගාර, එච්.සී.එම්, ලීසිං සහ අයි.සී.බී.එස් පද්ධතිවල පැවතුණි. | <u>පිනැකල් භාණ්ඩාගාර පද්ධතිය</u><br>අප දැනටමත් සඳහන් කර ඇති පරිශීලකයින් දෙදෙනෙකු අක්‍රිය කර ඇති අතර සියලුම පරිශීලකයින් දැන් පිනැකල් භාණ්ඩාගාර පද්ධතියේ "ක්‍රියාකාරී" තත්වයේ සිටී.<br><br><u>ලීසිං පද්ධතිය</u><br>සේවකයින් 41 දෙනාගෙන් 33 දෙනෙකු සේවයෙන් ඉල්ලා අස්වී නොමැත.<br><br>සේවකයින් දෙදෙනෙකු පමණක් ඉල්ලා අස්වී ඇති අතර සේවකයින් 6 දෙනෙකු බැංකු සේවයෙන් විශ්‍රාම ගොස් ඇත.<br><br>ඉල්ලා අස්වූ සහ විශ්‍රාමික සේවකයින් සඳහා ක්‍රියාකාරී තත්වයෙන් අක්‍රිය කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>කෙසේ වෙතත්, සේවයේ යෙදෙන සේවකයින් සඳහා පද්ධති මුරපදය අක්‍රීය කර ඇත.<br><br><u>අයි.සී.බී.එස් පද්ධතිය</u><br>සියලුම පරිශීලකයින් අයි.සී.බී.එස් පද්ධතියේ ක්‍රියාකාරී පරිශීලකයින් වන බැවින් පරිශීලක ගිණුම් ඉවත් කළ නොහැක. සියලුම පරිශීලකයින්ගේ මුරපදය අක්‍රීය කර ඇත.<br><br><u>එච්.සී.එම් පද්ධතිය</u><br>මුරපද දැනටමත් අක්‍රිය කර ඇත. අඛණ්ඩ විමසීම් හේතුවෙන් එච්.සී.එම් පැතිකඩ තත්ත්වය වෙනස් කළ නොහැක. | විවිධ පද්ධතිවල පවතින භාවිතයට නොගත් පරිශීලක ගිණුම් අක්‍රිය කිරීමට පියවර ගත යුතුය. |

iv පහත පද්ධතිවල යෙදුම් මට්ටමේ ආරක්ෂක වින්‍යාසයන් සඳහා ප්‍රමාණවත් මුරපද පරාමිතීන් අර්ථ දක්වා නොමැති අතර අඩුපාඩු පහත වගුවේ දැක්වේ.

| මුරපද පරාමිතිය | යෙදුම් | ව්‍යවහාරික සිටුවම | පරතරලෑම |
|---|---|---|---|
| අවම මුරපදයේ දිග | එච්.සී.එම්<br>ලීසිං | අනුලක්ෂණ 6<br>අනුලක්ෂණ 6 | අනුලක්ෂණ 8 ක් හෝ ඊට වැඩි |
| අනිවාර්ය මුරපද වෙනස් කිරීමේ වාර ගණන * | එච්.සී.එම් | දින 90 යි | දින 90 - මුරපද 4 ක් |
| නැවත මුරපදයක් භාවිතා කිරීමට පෙර භාවිතා කළ යුතු මුරපද ගණන * | එච්.සී.එම් | මුරපද 0 | |
| නිෂ්ක්‍රීය සැසිය ලොග්අවුට් වීමේ වේලාව | අයි.සී.බී.එස්<br>භාණ්ඩාගාර | විනාඩි 30<br>විනාඩි 30 | මිනිත්තු 15 හෝ ඊට අඩු |

* එකම මුරපදය අවම වශයෙන් වසරක්වත් භාවිතා නොකිරීමට මෙම පරාමිති දෙක එකිනෙකට සමගාමීව සකස් කළ යුතුය.

අවම මුරපදයේ දිග, කල් ඉකුත් වීමේ වාර ගණන සහ නිෂ්ක්‍රීය සැසිය ලොග් අවුට්වීමේ වේලාවට අනුකූල වන පරිදි පද්ධති පරාමිතීන් වෙනස් කළ හැකිය. නිර්දේශිත වින්‍යාසයන්ට අනුව කලින් භාවිතා කළ මුරපද පරීක්ෂා කිරීමේ හැකියාව බැංකුව ගවේෂණය කරයි.

යෙදුම් මට්ටමේ ආරක්ෂක වින්‍යාසයන් සඳහා ප්‍රමාණවත් මුරපද පරාමිතීන් අර්ථ දැක්විය යුතුය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 23 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. බිලියන 21 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 2 ක ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් උපයන ලද පොලී ආදායම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති නිදහස් කිරීම් හේතුවෙන් ආදායම් බදු වියදම් අඩුවීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

**2.2.1** සමාලෝචිත වර්ෂය තුළ හා පසුගිය වසර හතරක කාලපරිච්ඡේදයක් තුළ බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලය පහත වගුවේ සාරාංශ කර දක්වා ඇත.

| වර්ෂය | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| පොලී ආදායම (රු. මිලියන) | 220,477 | 195,394 | 171,344 | 134,685 | 112,745 |
| පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / අඩුවීම % | 13% | 14% | 27% | 19% | |
| පොලී වියදම් (රු. මිලියන) | 145,331 | 129,836 | 112,988 | 80,728 | 66,419 |
| පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / අඩුවීම % | 12% | 15% | 40% | 22% | |
| බදුවලට පෙර ලාභය ( රු. මිලියන ) | 29,685 | 33,416 | 30,343 | 31,189 | 25,279 |
| පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / අඩුවීම % | -11% | 10% | -3% | 23% | |

**2.2.2** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ පහත පරිදි දක්වා ඇත.

| විස්තර | විචලනා මුදල වැඩි වීම/ (අඩු වීම) (රු .000) | විචලනය % | විචලනතාවයට හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම | 25,083,204 | 13 | ප්‍රධාන වශයෙන් කාලීන ණය, අයිරා සහ පුද්ගලික ණය වැඩිවීමෙන් ණය සහ අත්තිකාරම් සඳහා පොලී ආදායම සියයට 17 කින් වැඩි වී ඇත. |
| පොලී වියදම | 15,494,700 | 12 | තැන්පතු පදනම 2018 දී ට්‍රිලියන 1.8 සිට 2019 අවසන් වන විට ට්‍රිලියන 2 දක්වා සියයට 13 ක වර්ධන වේගයක් පෙන්නුම් කරමින් ඉහළ ගොස් ඇත. |
| ණය හා වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු | 3,556,764 | 24 | සමස්ත කර්මාන්තයේම පවතින තත්වයට සමානව අක්‍රීය ණය සියයට 1.17 කින් වැඩි වී ඇත. |
| ආදායම් බදු | (5,826,233) | (47) | 2018 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් උපයන පොලී ආදායම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිදහස් කිරීමක් ලබා දී ඇත. |
| වෙනත් වගකීම් | 14,255,258 | 72 | 2019 වර්ෂයේ ආයුගණක තක්සේරු වාර්තාවට අනුව, බැංකුවේ විශ්‍රාම වැටුප් භාර අරමුදලේ ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම වැඩි වී ඇත. |

**2.3** අනුපාත විශ්ලේෂණය

-----------------------

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාතයන් පහත දැක්වේ.

| විස්තර | කර්මාන්තයේ අනුපාතය * | බැංකුව **2019** | **2018** |
|---|---|---|---|
| කාර්ය සාධන අනුපාත | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 10.6 | 16.8 | 17.3 |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.එ) | 1.0 | 1.3 | 1.6 |
| පොලී ආන්තිකය | 3.6 | 3.2 | 3.1 |
| වත්කම්වල ගුණාත්මක අනුපාතය | | | |
| දළ අක්‍රීය අත්තිකාරම් ( එන්.පී.එල්) | 4.6 | 4.8 | 3.6 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 10 %) | 13.0 | 11.16 | 10.3 |
| මුළු ප්‍රාග්ධනය (අවම 14 %) | 16.6 | 15.58 | 14.58 |
| ව්‍යවස්ථාපිත අනුපාතය | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාව 20%) | 27.8 | 24.6 | 24.5 |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (අවම අවශ්‍යතාව 100% ) | | 125.6 | 115 .0 |

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද තොරතුරු වලින් කර්මාන්තයේ අනුපාත උපුටා ගන්නා ලදි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය විසින් මූල්‍ය හා මූල්‍යමය නොවන වටිනාකම් සමඟ සම්බන්ධ වී ඇති 2020 වර්ෂය තුළදී හඳුනාගත් වංචනික සිද්ධීන් 24 ක් සහ 2019 වර්ෂය තුළදී හඳුනාගත් වංචනික සිද්ධීන් 40 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් කර ඇත. වංචනික සිද්ධීන් පිළිබඳ විස්තර ඇමුණුම 01ලෙස මෙම වාර්තාවේ දැක්වේ. | එකඟ වේ. | වංචා වළක්වා ගැනීම සඳහා බැංකුවේ අභ්‍යන්තර පාලනයන් තවදුරටත් ශක්තිමත් කළ යුතුය. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල කුලියට ගැනීම සම්බන්ධයෙන් බැංකුව සහ දේපල සංවර්ධන පීඑල්සී අතර ඇති කර ගත් කුලී ගිවිසුම 2019 ජුනි 30 දිනෙන් අවසන් වී ඇත. කුලිය අඩු කිරීම සම්බන්ධයෙන් දේපල සංවර්ධන පීඑල්සී සමඟ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතින බැවින් පාර්ශව දෙක අතර ගිවිසුමක් අත්සන් කර නොමැත . පෙර ගිවිසුමෙන් එකඟ වූ පරිදි කුලී ගෙවා ඇත. | බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ජූලි 01 සිට 2020 මාර්තු 31 දක්වා වූ කාල සීමාව සඳහා පමණක් අනුමැතිය ලබා දී ඇත. තවද, 2020 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි නව තක්සේරුවක් මත පදනම්ව දේපල සංවර්ධන පීඑල්සී වෙතින් කුලිය අඩු කිරීමක් ඉල්ලා සිටින ලෙස මණ්ඩලය උපදෙස් දී තිබේ. ගිවිසුම් කාලය අවුරුදු 3 ක් වන බැවින්, ඉතිරි කාලය සඳහා කුලිය තීරණය කර ගත යුතු වේ. දේපල සංවර්ධන පීඑල්සී සමඟ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. 2019 ජුලි 01 සිට වසර 3 ක මුළු කාලය සඳහා කුලිය තීරණය කර ගැනීමෙන් පසු ගිවිසුම ක්‍රියාත්මක කරනු ලැබේ. | නිර්දේශිත කුලී වටිනාකම තීරණය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කර බැංකුව සහ දේපල සංවර්ධන පීඑල්සී අතර නව ගිවිසුමකට එළඹීම. |
| ii | ලංකා සතොස සමාගමට ප්‍රදානය කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 45 ක සහ ඇමරිකානු ඩොලර් මිලියන 11.25 ණය සඳහා සපයන ලද භාණ්ඩාගාර | ලංකා සතොස සමාගමේ භාණ්ඩාගාර ඇපකර 2015.04.30 දින සහ 2015.07.31 දින අහෝසි විය. 2015.04.30 දින සහ 2015.07.27 දින හිමිකම් පවරන ලදී. ආනයන ණය සඳහා මීළඟ වාර්ෂික අයවැය අනුමත කිරීමෙන් පසු | භාණ්ඩාගාර ඇපකර ලබා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |

| | |
|---|---|
| ඇපකර පිළිවෙළින් **2015** අප්‍රේල් **30** දින සහ 2015 ජූලි **31** දින කල් ඉකුත් වූ බව නිරීක්ෂණය වූ අතර අලුත් කිරීමක් 2020 ඔක්තෝබර් 13 දින වන විටත් සිදු වී නොතිබුණි. | ණය සේවාකරණ වෙනුවෙන් (2019.12.30 දක්වා ප්‍රාග්ධනය සහ පොළිය පමණක්) වාර්ෂික අයවැය ප්‍රතිපාදන සඳහා **2020.02.26** වැනි දින කැබිනට් අනුමැතිය ලබා දී ඇත. (බැංකුව විසින් 2020.01.01 දින සිට නැවත සකස් කළ දිනය දක්වා පොළිය අත්හැරිය යුතුය). |

**3.3** මත භේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මාර්තු 04 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව 2020 වර්ෂය තුළදී බැංකුව විසින් අපරිණත විශ්‍රාම ප්‍රතිලාභ ලෙස හිටපු සාමාන්‍යාධිකාරී වෙත එකතුව රු.32,039,733 ක් වූ මත භේදයට තුඩුදෙන ගෙවීමක් සිදු කර ඇත. ගෙවීම් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත. | - | වැරදි පූර්වාදර්ශයක් ලබා දෙන මත භේදයට තුඩුදෙන ගෙවීම් වලින් වැළකීම. |

| ගෙවීම් වර්ග | වටිනාකම (රු.) |
|---|---:|
| විනෝදාස්වාද දීමනා | 7,564,516 |
| බෝනස් | 9,007,16 9 |
| බෝනස් අත්තිකාරම් ගෙවීම 2020 අප්‍රේල් | 411,586 |
| විශ්‍රාම වැටුප් භාර අරමුදලට දායක වීම | 5,814,877 |
| වැටුප් හා විශ්‍රාම වැටුප් අතර සියයට 15 වෙනස | 7,049,516 |
| භාර අරමුදලට දායක වීම | 1,453,719 |
| වාහන ප්‍රතිලාභ | 656,250 |
| වාහන නඩත්තු පිරිවැය | 82,100 |
| එකතුව | **32,039,733** |

**3.4** ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුව විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන අත්පොතේ 4.2 ඡේදයට අනුව 2019 මුදල් වර්ෂය සඳහා බැංකුව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. ඇස්තමේන්තුගත වටිනාකමට | පහත සඳහන් හේතු නිසා තත්‍ය වියදම් අයවැයගත වටිනාකමට වඩා අඩුය.<br>i) සමහර තොරතුරු තාක්ෂණ | සියලු බාහිර සාධක සලකා බලා ප්‍රසම්පාදන සැලැස්ම වඩාත් |

සාපේක්ෂව ලබා ඇති ප්‍රගතිය විශ්ලේෂණය කිරීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය කරන ලදී. විස්තර පහත දැක්වේ.

| ප්‍රසම්පාදන වර්ගය | ඇස්තමේන්තුගත වටිනාකම (රු. මිලියන) | තත්‍ය (රු. මිලියන) | ප්‍රගතිය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| වාහන | 959 | 299 | 31.18 |
| ඉඩම් | 1,500 | 770 | 51.33 |
| තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ උපකරණ | 4,779.5 | 3420.5 | 71.57 |
| ශාඛා පරිවර්තනය | 1,500 | 347.2 | 23.15 |
| ඉදිකිරීම් | 4,315 | 3,035 | 70.34 |

ප්‍රසම්පාදනයන් අවලංගු කිරීම.

ii) වාහන මිලදී ගැනීම අවලංගු කිරීම; රජයේ ආයතන සඳහා වාහන මිලදී ගැනීම සඳහා රජය විසින් පනවා ඇති සීමාවන්ට අනුව ආසන 16 වැන් 02 ක්, එස්.යූ.වී වර්ගයේ වාහන 16 ක්, කෑෂ් කැරියර් 4 ක්, මෝටර් සයිකල් 60 ක්, ප්‍රචාරක වාහන 1 ක් මිලදී ගැනීම අවලංගු කිරීම.

iii) පාරිසරික සාධක හේතුවෙන් සිදු වූ සම්පූර්ණ කිරීමේ සහ ආරම්භ කිරීමේ ප්‍රමාදයන් (උදා -2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ඉරුදින ප්‍රහාරය, 2019 මැයි සිට දෙසුම්බර් දක්වා පැවැති අධික වර්ෂාපතනය, 2019 නොවැම්බර් පැවැති ජනාධිපතිවරණය)

iv) ප්‍රසම්පාදන පද්ධතියක්, ඩෙස්ක්ටොප් විෂුවලයිසේශන් පද්ධතියක්, ප්‍රධාන ගොඩනැගිල්ලේ භූමි යටිතල පහසුකම් වැනි 2019 වර්ෂයේ සැලසුම්කරන ලද තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනයන් කිහිපයක් ආරම්භ නොවීම

සැලකිලිමත් ලෙස සකස් කිරීම සහ ඇස්තමේන්තුගත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා සතුටුදායක ප්‍රගතියක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i | 2019 වර්ෂය සඳහා බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලය සේවකයින් 11,310 ක් වූ අතර එදිනට තත්‍ය සේවක සංඛ්‍යාව 10,058 ක් වන අතර එය ස්ථිර කාර්ය මණ්ඩලය 8,503 කින් සහ කොන්ත්‍රාත් පදනම් මත සේවකයින් 1,555 කින් සමන්විත වේ. ඒ අනුව, 2019 දෙසැම්බර් 31 වන දිනට තනතුරු 1,252 ක් පුරප්පාඩු වී ඇත. | අවශ්‍ය කාර්ය මණ්ඩලය තක්සේරු කිරීමෙන් අනතුරුව එච්.ආර්.පී.සී හි නිර්දේශය සහිතව බැංකුව සඳහා නව සේවකයින් බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. | බැංකුවේ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| ii | අනුමත කාර්ය මණ්ඩලය වූ සේවකයින් 126 දෙනෙකු සමඟ සසඳන විට 2019 දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු වූ තනතුරු හතළිස් අටක් (48) ක් නිරීක්ෂණය විය. පහත කාර්ය මණ්ඩල කාණ්ඩවල පුරප්පාඩු පවතී. | පුරප්පාඩු බොහොමයක් නව උසස්වීම් සහිත නිළධාරීන් අනුයුක්ත කිරීමෙන් පුරවා ඇත. එනම් සහකාර සාමාන්‍යාධිකාරීවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආදිය.<br>මෑතකදී, විමර්ෂණ සඳහා නිළධාරීන් අනුයුක්ත කිරීමට අයදුම්පත් කැඳවා තිබුණු අතර ඒ අනුව නිළධාරීන් 06 ක් පත් කර ඇත. | අභ්‍යන්තර විගණන කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |

| කාර්ය මණ්ඩල කාණ්ඩය | පුරප්පාඩු ගණන |
|---|---|
| සහකාර සාමාන්‍යාධිකාරී | 02 |
| වරලත් ගණකාධිකාරීවරුන් බැංකු නොවන | 07 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු | 04 |
| ශාඛා කළමනාකරු | 09 |
| සහකාර කළමනාකරු | 05 |
| විධායක නිලධාරී | 04 |
| විධායක විගණන නිලධාරී - බැංකු නොවන | 08 |
| කණිෂ්ඨ විධායක නිලධාරී | 02 |
| කනිෂ්ඨ විගණන නිලධාරී - බැංකු නොවන | 01 |
| මාණ්ඩලික සහකාර | 05 |
| විගණන සහකාර - බැංකු නොවන | 01 |
| එකතුව | **48** |

ඇමුණුම **01**

| වංචාවේ ස්වභාවය | **2020** වර්ෂය | | **2019** වර්ෂය | |
|---|---|---|---|---|
| | සිද්ධීන් ගණන | මූල්‍ය වටිනාකම (රු.) | සිද්ධීන් ගණන | මූල්‍ය වටිනාකම (රු.) |
| වංචනික පී.ඕ.එස් ගනුදෙනු | 1 | 25,000 | 2 | 163,574 |
| වංචනිකව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලින් ආපසු ගැනීම් | 5 | 869,494 | 5 | 392,529 |
| Just Pay හරහා වංචනික අරමුදල් ගනුදෙනු | 8 | 317,343 | - | - |
| ගනුදෙනුකරුවන්ගේ කැමැත්තෙන් තොරව ණය ලබා දීම සහ මුදල් ආපසු ගැනීම<br>(වංචාවේ ස්වභාවය: ලබා දී ඇති ණය පහසුකම් මත අක්‍රමිකතා සහ සේවකයෙකු විසින් ව්‍යාජ ලියකියවිලි මත පදනම්ව මුදල් ආපසු ගැනීම) | 1 | 1 4,5 00,000 | | |
| මතු දූතම් කළ චෙක්පත් මත පදනම්ව ලබා දී ඇති ණය පහසුකම් මත අක්‍රමිකතා | 2 | 7,147,000 | 1 | 13,360,000 |
| සේවකයෙකු විසින් භෞතික මුදල් නොමැතිව චෙක්පත් ලබා ගැනීමෙන් බැංකු අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීම | 1 | අදාළ නැත | - | - |

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යාජ / නිෂ්ඵල ද්‍රව්‍යය උකස් කිරීම | 1 | 32,000 | 1 | 764,000 |
| Skimmed කාඩ් ගනුදෙනු | 1 | 3,100 | 3 | 1,481,447 |
| සේවකයෙකු විසින් රැකියාවට බැදෙන අවස්ථාවේදී ව්‍යාජ සුදුසුකම් ඉදිරිපත් කිරීම | 2 | අදාළ නැත | | |
| ගණුදෙනුකරුවකුගේ ගිණුමකින් සේවකයෙකු විසින් ආපසු ගැනීම් | 1 | 15,000 | | |
| සේවකයෙකු විසින් ගනුදෙනුකරුවන්ගෙන් හිස් චෙක්පත් එකතු කිරීමෙන් වංචාව කිරීම | | - | 1 | 484,000 |
| නිලධාරියාගේ අවසරයකින් තොරව නිලධාරියාගේ මුරපදය භාවිතා කිරීමෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත් නිර්මාණය කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ පොලී මුදල් වංචා කිරීම | | - | 1 | 14,053 |
| සේවකයෙකු විසින් ඔහුගේ නමින් භෞතික මුදල් නොමැතිව පද්ධතියේ ව්‍යාජ ස්ථාවර තැන්පතු නිර්මාණය කිරීම | | - | 1 | 8,115,000 |
| උකස් තැබීමේදී වංචනික පහසුකම් සහ අක්‍රමිකතා ඇති කිරීම | | - | 1 | අදාළ නැත |
| සේවකයෙකු විසින් අයදුම්පතක් මත ව්‍යාජ ඇතුළත් කිරීම් සිදු කිරීම | | - | 1 | අදාළ නැත |
| පොදු ලේජර ගිණුම් හර කිරීමෙන් සේවකයෙකු විසින් බැංකු අරමුදල් වංචා කිරීම | | - | 2 | 22,249,577 |
| සේවකයෙකු විසින් සූදුව සඳහා බැංකු අරමුදල් වංචා කිරීම | | - | 1 | 86,700 |
| වංචනික ශේෂ තහවුරු කිරීම් | | - | 4 | අදාළ නැත |
| වංචනිකව මුදල් ආපසු ගැනීම් | | - | 1 | 102,000 |
| වංචනික චෙක්පත් ගෙවීම් | | - | 2 | 318,000 |
| වංචනික අරමුදල් මාරු කිරීම් | | - | 1 | ඩොලර් 311,040 |
| අන්තර්ජාල බැංකු පහසුකම හරහා වංචනික අරමුදල් මාරු කිරීම් | | - | 2 | 1,437,400 |
| පද්ධති ඇණහිටීම් හේතුවෙන් වංචනික පී.ඕ.එස් ගනුදෙනු | | - | 1 | 19,590 |
| නීතිවිරෝධි මත්පැන් තොග සහ ගනුදෙනුකරුවන්ගෙන් මුදල් වංචා කිරීම | | - | 1 | 20,100 |
| ප්‍රදානය කරන ලද කල්බදු පහසුකම් මත අක්‍රමිකතා සහ සීමාවන් | | - | 1 | අදාළ නැත |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණයක් ලෙස ලබා දී | | - | 1 | 131,000,000 |

**ඇති ණය පහසුකම් මත අක්‍රමිකතා**

| | | | |
|---|---|---|---|
| **ඥාතීන්ට ලබා දී ඇති ණය පහසුකම් මත අක්‍රමිකතා** | - | 2 | 15,000,000 |
| **මතු දුතම් කළ චෙක්පත් මත පදනම්ව ලබා දී ඇති බැංකු අයිරා පහසුකම් මත අක්‍රමිකතා** | - | 2 | 60,000,000 |